**පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය- 2013**

---

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව ( ආසබැ) අතර 2006 ජනවාරි 19 දින එළඹි අංක 2201 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව , පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, ව්‍යාපෘති ප්‍රදේශය තුළ තෝරාගත් පළාත් පාලන ආයතනවල සංවර්ධනය සඳහා වූ හැකියාව වැඩි කිරීම හා දිළිඳුකම අඩු කිරීමයි. ව්‍යාපෘති කාර්යය වන්නේ, (i) යටිතල පහසුකම් හා සේවා වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම, (ii) නාගරික ජීවන තත්වයන් ඉහළ නැංවීම, සහ (iii) නාගරික කළමනාකරණය, සැලසුම් කිරීම හා පළාත් පාලන ආයතනවල මූල්‍යයන ධාරිතාවය වැඩිදියුණු කිරීම මඟින් නාගරික පරිසරය, ව්‍යාපෘති ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ජනතාවගේ ආර්ථික හා ජීවන තත්වයන් වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 66.7 ක් වූ අතර එයින් එ.ජ ඩොලර් මිලියන 50 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. 2006 ජුලි 04 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2011 ඔක්තෝබර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ආසියානු සංවර්ධන බැංකුවේ 2012 අප්‍රේල් 26 දිනැති ලිපියට අනුව, ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2013 ජනවාරි 30 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකත්වය භාවිතයෙන් ව්‍යාපෘති කාර්යයන් 2013 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මුල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු , වත්කම් , වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම් , ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ , එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වූයේද යන බව.

**3.** **මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක හා අවසාන ශේෂ, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**4.1** **මූල්‍ය කාර්ය සාධනය**

**------------------------**

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 16,149,228 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 6,294,027,071 ක් විය. ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් සංරචක අනුව පහත දැක්වේ.

| වියදම් විෂය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | Rs. | Rs. | Rs. |
| <u>ඒ- සංරචකය</u> | | | |
| වැඩ මුළු | - | 599,815 | 5,878,418 |

| | | | |
|---|---|---|---|
| මිනිස් බල සංවර්ධනය | - | 20,248,824 | 52,567,075 |
| **<u>බී - සංරචකය</u>** | | | |
| සිවිල් ඉංජිනේරු | - | 1,447,524,413 | 4,418,555,009 |
| උපකරණ | - | 34,275,045 | 453,905,749 |
| **<u>සී- සංරචකය</u>** | | | |
| දේපළ පිරියත හා උපකරණ | - | 168,329 | 87,111,839 |
| නවීකරණය | - | - | 4,675,132 |
| උපදේශක සේවා | 106,644 | 77,799,913 | 597,953,295 |
| පරිපාලන වියදම් | 16,042,584 | 94,444,454 | 564,539,452 |
| ණය පොලී | - | 45,969,250 | 108,841,103 |
| | ------------------- | ------------------- | -------------------- |
| | 16,149,228 | 1,721,030,043 | 6,294,027,072 |
| | ========= | ========= | ========= |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මුල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය පහත දැක්වේ.

| | <u>එජඩො</u> | <u>රු.</u> |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 1,803,147.18 | 229,289,638 |
| එකතුකළා :- ඌනපුර්ණයන් | 152,165.84 | 19,948,942 |
| විදේශ විනිමය වාසිය | - | 260,147 |
| | --------------- | ------------------- |
| | 1,955,313.02 | 249,498,727 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 1,457,122.21 | 184,358,784 |
| | -------------- | ---------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 498,190.81 | 65,139,943 |
| | ======== | ========= |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) ඡේදය අනුව විගණනය කරන ලද වාර්ෂික මුල්‍ය වාර්තාව මුල්‍ය වර්ෂය අවසන් වී මාස 6 ක් තුල ණය දෙන නියෝජිතායතනය වෙත ඉදිරිපත් කල යුතු වේ. කෙසේ වුවද, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ කෙටුම්පත් මුල්‍ය වාර්තාව 2014 ඔක්තෝබර් 17 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 5.2 ගණකාධිකරණ අඩුපාඩු

------------------------

රු. 87,111,839 ක් වටිනා වත්කම් 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දිගින් දිගටම පෙන්නුම් කරමින් පැවතුනද එම වත්කම් දැනටමත් පළාත් පාලන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය නම් ව්‍යාපෘතියකට මාරුකර තිබුණි.

## 5.3 අරමුදල් උපයෝජනය

----------------------

අරමුදල් මුල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

* 2011 සැප්තැම්බර් 08 දිනැති විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ලිපිය පරිදි මුල්‍යානය කිරීමට එකඟවූ ඩොලර් මිලියන 50 ක් වූ මුළු අගයකින් ඩොලර් මිලියන 04 "පළාත් පාලන වැඩිදියුණු කිරීමේ ආංශීක ව්‍යාපෘතිය (පුරනැගුම)" නම් වූ ව්‍යාපෘතියකට මාරු කර තිබුණි.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මුල්‍යානය සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| ආසබැ | 46.0* | 4,933 | 181 | 168.28 | 4,511.28 | 91.45 |
| ශ්‍රීලංර | 16.7 | 1,541 | 71 | 70.1 | 1,421.1 | 92.21 |
| එකතුව | 62.7 | 6,474 | 252 | 238.38** | 5,932.38** | 91.63 |

** පළාත් පාලන ආයතනවල දායකත්වය ඇතුළත් නොවීම නිසා මෙම අගයන් වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන අගයන් සමඟ එකඟ නොවේ.

## 5.4 ව්‍යාපෘති කාර්යයන් අවසන් කිරීම

-----------------------------------

2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් කිරීමට සැලසුම් කර තිබුණු අතර 2013 අප්‍රේල් ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් ව්‍යාපෘතියේ අවසන් වාර්තාව බාරදී තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.